ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම හා රඳවාගත් ඉපයීම් පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම විසින් සැපයූ සේවාවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.39,608,296 ක ශේෂය තුළ වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ පවතින එකතුව රු.5,131,827 ක් වූ ශේෂ 24 ක් හා වර්ෂ 5-10 අතර කාලයක සිට පවතින එකතුව රු.14,643,151 ක් වූ ශේෂ 36 ක් විය. මෙම ශේෂ අයකර ගැනීමට 2025 වර්ෂයේ මාර්තු 31 වන විටද කටයුතු කර නොතිබුණි.	මෙහි ඇතුළත් වසර 05 කට පෙර ණයගැති ශේෂයන් ගිණුම්වලින් කපා හැරීමට අදාලව විගණන හා කළමනාකරණ කමිටුවට තොරතුරු ඉදිරිපත් කර ඇත.	ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට පියවර ගත යුතුය.

1.5.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම විසින් සපයනු ලබන සේවා ලබා ගැනීම සඳහා ආයතන හා පුද්ගලයන් 259 ක් විසින් 2010-2024 කාලය තුළ එකතුව රු.26,736,993 ක් වූ අත්තිකාරම් සමාගම වෙත ගෙවා තිබුණි. ඒ තුළ වර්ෂ 5 ඉක්මවූ රු.4,231,495 ක් වූ අත්තිකාරම් ශේෂ 108 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.	වර්ෂ 05 ඉක්මවූ අත්තිකාරම් මුදල් ආයතනයේ ආදායමක් ලෙස හඳුනා ගැනීම සඳහා වූ ප්‍රතිපත්තිය 2024 වර්ෂයේ සැප්තැම්බර් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළද, එහි ලිඛිත සංශෝධිත සනාථ වීම (Minutes) 2025 මාර්තු මස ලැබී ඇත. මේ අනුව අදාල ගැලපුම් 2025 මූල්‍ය වර්ෂයේ සිට ඉදිරියට අනුමත වූ ප්‍රතිපත්තිය අනුව කටයුතු කරනු ඇත.	අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය			
(i) 12 වගන්තිය	ශ්‍රී ලංකාවේ හෝ වෙනත් තැන්වල නව සහ පවතින ඛනිජ ආශ්‍රිත කර්මාන්ත වෙත යාවත්කාලීන භූ විද්‍යාත්මක දත්ත සහ තොරතුරු සැපයීම කළ යුතු වුවත් ඒ සඳහා දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි.	ශ්‍රී ලංකාවේ වෙනත් තැන්වල පවතින හා නව ඛනිජ ආශ්‍රිත කර්මාන්ත වෙත යාවත්කාලීන භූ විද්‍යාත්මක දත්ත සහ තොරතුරු සැපයීම සඳහා දත්ත පද්ධතියක් සැකසීම යන වගන්තිය සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික නිලධාරීන් දැනුවත් කිරීමක් හෝ මෙහෙයවීමක් මෙතෙක් ආයතනයේ ඉහළ කළමණාකාරීත්වය මඟින් සිදු නොවුණු අතර වාර්ෂික කාර්ය සාධනයන් ඇගයීම යටතේදීවත් මෙම වගන්ති වල අරමුණු ඉටු කිරීම පිළිබඳ උපදෙස් ලබා දීමක් සිදු නොවුණි.	සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් මූලික අරමුණු ඉටු කිරීමට අවශ්‍ය කටයුතු ආයතනය විසින් සිදුකළ යුතුය.
(ii) 13 වගන්තිය	ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක ඛනිජ ආශ්‍රිත නව සහ පවතින කර්මාන්ත සඳහා සැකසීම, නිෂ්පාදනය කිරීම සහ ඵලදායීත්වය වැඩි කිරීම පිළිබඳ උපදෙස් ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී එම කාර්යය ඉටු කර නොතිබුණි.	අදාල වර්ෂය තුල ඛණිජ ආශ්‍රිත සැකසීම්, නිෂ්පාදන හෝ අගය එකතු කිරීම් සඳහා උපදෙස් ලබා ගැනීමට සේවාදායකයින් ඉදිරිපත් වී නොතිබීම මත එවැනි සේවාවන් සමාගම ක්‍රියාත්මක කර නැත.	සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් මූලික අරමුණු ඉටු කිරීමට අවශ්‍ය කටයුතු ආයතනය විසින් සිදුකළ යුතුය.

	(iii) 16 වගන්තිය	ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක කර්මාන්තයන්ගේ ඉල්ලුමට ගැලපෙන පරිදි සුදුසු තාක්ෂණික සංවර්ධන කටයුතු සිදුකළ යුතු වුවද එසේ කර නොතිබුණි.	සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය තුල අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය, එහි සමබරතාව, වගවීම පිළිබඳ නිරීක්ෂණයන් හා නිවැරදි කිරීම් ඉදිරිපත් නොවන පසුබිමක ඉහත සඳහන් සාංගමික ව්‍යවස්ථාවලියෙහි ආයතනික කටයුතු කාර්යභාර්ය පිළිබඳ පමණක් නිරීක්ෂණයන් ලබා දීම ප්‍රායෝගික නොවනු ඇත.	සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් මූලික අරමුණු ඉටු කිරීමට අවශ්‍ය කටයුතු ආයතනය විසින් සිදුකළ යුතුය.
(ආ)	2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 ඡේදය	සෑම පරිපාලිත සමාගමක්ම මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ පරිපාලන හා මූල්‍ය අත්පොතක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව පිළියෙල කළ යුතු වුවත් එසේ අත්පොතක් සමාගම පිළියෙල කර නොතිබුණි.	කෙටුම්පත් කරන ලද මානව සම්පත් හා පරිපාලන මෙහෙයුම් අත්පොත 2025 මාර්තු 21 වන දින ආයතනයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර එය සමාලෝචනය සඳහා මානව සම්පත් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයා විසින් සටහනක් යොදා ඇත. මෙම කමිටුව වෙත දැනට සාකච්ජා කල යුතු කරුණු කිහිපයක් පවතින බැවින් මෙම කෙටුම්පත් කරන ලද මානව සම්පත් කළමනාකරණ අත්පොතද අදාල කමිටුව වෙත ඉදිරිපත් කර ඉන්පසු ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පරිපාලන හා මූල්‍ය අත්පොතක් සකස් කර අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.86,562,911 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.122,969,619 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.36,406,708 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් මෙහෙයුම් නොවන ආදායම රු.39,469,639 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශේෂ ව්‍යාපෘති අංශය තුළින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති රු.9,103,617 ක මූල්‍ය අලාභයක් ලබා තිබුණු අතර 2021, 2022 හා 2023 වර්ෂවලදී ද පිළිවෙලින් රු.5,579,669, රු.8,552,276 හා රු.6,265,173 ක මූල්‍ය අලාභයන් ලබා තිබුණි. කෙසේ වුවද මෙම තත්ත්වය වැළැක්වීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 වර්ෂය තුල විශේෂ ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල බලපත්‍ර ලබා ගැනීම මෙන්ම, මූලික අදියරේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුනු අතර, මේ හේතුවෙන් 2024 වර්ෂය තුල ශුද්ධ ලාභයක් ඉපයීමට විශේෂ ව්‍යාපෘති අංශයට හැකියාවක් නොලැබුණි. විශේෂ ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක වන ප්‍රධානම ව්‍යාපෘති වන කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය සඳහා මෙන්ම, කොටිකම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අනුමැතීන් ලබාදීමට ප්‍රමාදවීම නිසා එම ව්‍යාපෘති දෙක ආරම්භ කිරිමට නොහැකි විය.	මූල්‍ය අලාභයන් වැළැක්වීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	කෑගල්ල දිස්ත්‍රික්කයේ බතමුරේ ග්‍රාම නිලධාරී වසමට අයත් මා ඔයේ වැලි කැණීම් ව්‍යාපෘතිය 2023 වර්ෂයේදී ආරම්භකර තිබූ අතර මේ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් කැණීම් බලපත්‍ර දෙකක් ලබාගෙන තිබුණි. එකී බලපත්‍ර යටතේ වැලි කියුබ් 375 කට ආසන්න ප්‍රමාණයක් කැණීම් කළ යුතු වුවද ඉන් සියයට 6 ක් එනම්, කියුබ් 24 ක් පමණක් කැණීම් කර තිබුණි. කැණීම්කරුවන් සොයා ගැනීමට ඇති අපහසුතාවය හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ කටයුතු 2025 ජනවාරි 07 දින නවතා දැමීමට සමාගම කටයුතු කර තිබූ අතර නිසි සැලසුමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය තුළින් රු.988,426 ක සමස්ත මූල්‍ය අලාභයක් ජනනය කර තිබුණි.	ව්‍යාපෘතිය ආරම්භ කිරිමේදී පැවති ගැටළුකාරී තත්ත්වය මත මෙම ව්‍යාපෘතියේ මේ වන විට අලාභයක් සිදුව තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව හඳුන්වා දුන් නව ක්‍රමවේදය අනුව ඉතා ඉක්මනින් මෙම ව්‍යාපෘතිය ලාභ ලබන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවති. එම ක්‍රමවේදය යටතේ එක් එක් මංකඩ සඳහා ඔහු විසින් ගොඩ දැමිය යුතු අවම කියුබ් ප්‍රමාණය ගොඩ දැමීමට ඔහු අපොහොසත් වුවහොත් ඊට අදාලව ගිවිසුමේ සඳහන් පරිදි ගෙවිය යුතු මුදල අප ආයතනය වෙත ඔහු විසින් ගෙවිය යුතුය.	නිසි ශක්‍යතා අධ්‍යයනයක් සහිතව ව්‍යාපෘතින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘතිය ලාභ ලබන තත්ත්වයට පත්කළ යුතුය.
(ඇ)	කන්තලේ සිරිමංගලපුර වැලි විකුණුම් මධ්‍යස්ථානය 2023 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යය ආරම්භ කිරීමට	රාජ්‍ය ආයතන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නිතීමය පසුබිම සකස් කර දීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වීම පිළිබඳව 2024 ජනවාරි	නිසි ශක්‍යතා අධ්‍යයනයකින් හා අවශ්‍ය නීත්‍යානුකූල පසුබිම සකස්කර

	සමාගම අපොහොසත් වී තිබුණු පසුබිමක ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් නවතා දැමීමට 2024 ජනවාරි මස 26 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. මෙහිදී ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කර තිබූ නිලධාරීන්ගේ වැටුප්, ප්‍රවාහන වියදම් සහ නවාතැන් වියදම් සඳහා ගෙවූ රු.1,765,917 ක සමස්ත වියදම නිශ්කාර්යව පැවතුණි.	26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු වාර්තා කළ පසු ව්‍යාපෘතියේ කටයුතු නවතා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් ලබාදී ඇත. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නිලධාරීන් ආයතනයේ කාර්ය මණ්ඩලය තුළින්ම අනුයුක්ත කර කළමනාකරණය කරගෙන ඇති බැවින් වැටුප් සහ වේතනයන් සඳහා අමතර වියදමක් දැරීමට සිදු නොවූ අතර නවාතැන් සහ අනෙකුත් වියදම් සඳහා ආසන්න වශයෙන් රු.288,227 ක පමණ මුදලක් ව්‍යාපෘතිය වෙනුවෙන් දරා ඇත. සාර්ථක හෝ අසාර්ථක ඕනෑම ව්‍යාපෘතියක් සඳහා මූලික අධීක්ෂණ කටයුතු සහ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වෙනුවෙන් නියැලෙන නිලධාරීන්ගේ පහසුකම් වෙනුවෙන් යම් පිරිවැයක් දැරීමට සිදුවේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ද ඉහළ පිරිවැයක් දරා ඇත.	ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නිසි සැලසුමකින් තොරව සිදු කරන ලද වියදම් සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතුය.
(ඇ)	සමාගම විසින් ත්‍රිකුණාමලය පරෙයිපඤ්ඤම් ප්‍රදේශයේ 2020 වර්ෂයේ අගෝස්තු මස ආරම්භ කරන ලද මුතූර් වැලි කැණීම් ව්‍යාපෘතිය දිගින් දිගටම පාඩු ලබන තත්ත්වයක් පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට 2022 වර්ෂයේ කටයුතු කර තිබුණද 2022 වර්ෂයේදීම මෙම ව්‍යාපෘතියේ කටයුතු නවතා දමා තිබුණු අතර ඒ සඳහා 2024 ජුලි 25 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ රු.8,058,807 ක සමස්ථ මූල්‍ය අලාභයක් ව්‍යාපෘතිය තුළින් ලබා තිබුණි.	මුතූර් වැලි කැණීම් ව්‍යාපෘතියේ සිදුවුනු ගැටළු පිළිබඳව අප ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මෙන්ම පරිසර අමාත්‍යාංශය මගින්ද පරීක්ෂණයක් සිදු කල අතර, පරිසර අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාවද මේ වන විට ආයතනය වෙත යොමු කර ඇත. කෙසේ වෙතත්, මෙම වැලි කැණීම් ව්‍යාපෘතියට ආසන්නව පිහිටි වෙල්ලනාවල් ප්‍රදේශයේ පිහිටි පාලමක් ඇලවීම නිසා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නවතා තිබුණ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව එම ව්‍යාපෘතිය නවතා දමා ඇත.	ව්‍යාපෘතියේ කටයුතු විධිමත් පරිදි කාර්යක්ෂමව සහ සඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද යක්කල වැලි අලෙවි මධ්‍යස්ථානයට අදාළව 2024 වර්ෂයේ කිසිදු වැලි අලෙවියක් සිදුකර නොතිබුණු අතර එම	මේ වන විට යක්කල වැලි අංගනයේ කටයුතු විධිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නව ක්‍රමවේදයක් හඳුන්වා දුන් අතර, යක්කල	විධිමත් අලෙවි සැලැස්මක් සකස් කර විකුණුම් සිදු කිරීමට අවශ්‍ය

	මධ්‍යස්ථානය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.974,132 ක වියදමක් පමණක් නිශ්කාර්යව දරා තිබුණි	මෙම වැලි අංගනය පිහිටි ඉඩමේ හිමිකාරිත්වය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලබාදීමේදී ඇතිව තිබූ ගැටළුවක් නිසා ගබඩා බලපත්‍රය අළුත් කර ගැනීමට නොහැකි වී ඇත.	පියවර ගත යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේදී නව නගර වැලි අලෙවි මධ්‍යස්ථානය මගින් රු.2,146,347 ක මූල්‍ය අලාභයක් වාර්තා කර තිබුණි. එසේම 2022 වර්ෂයේ සිට එක් සේවකයෙකු පමණක් අනුයුක්ත කර තිබූ මෙම මධ්‍යස්ථානය සඳහා සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස සිට අමතර සේවකයන් 06 දෙනෙකු අනුයුක්ත කර තිබීම හේතුවෙන් ව්‍යාපෘති පිරිවැය රු.922,949 කින් ඉහළ ගොස් තිබුණි.	2025 වර්ෂය තුල එම ව්‍යාපෘතිය ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය උපායමාර්ග සැලසුම් සකස් කරමින් පවතී. කෙසේ වෙතත්, 2024 වර්ෂය තුල රු.387,613 ක අලාභයක් ව්‍යාපෘතිය විසින් වාර්තා කර ඇති අතර විගණනය විසින් නිරීක්ෂණය කරන ලද රු.2,146,346 ක් දක්වා ඉහළ අලාභයක් ගණනය වීමට ප්‍රධානතම වශයෙන් බලපාන ලද්දේ ව්‍යාපෘතියට අදාල නොවන අමතර නිලධාරින් කණ්ඩායමක් පැමිණීම සළකුණු කිරීම සඳහා එම ව්‍යාපෘතිය වෙත යොමු කර තිබීමයි.	වැලි විකුණුම් මධ්‍යස්ථානයේ අලෙවිය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර අතිරික්ත සේවකයන් නොයෙදවීමට සමාගම වග බලා ගත යුතුය. එසේම ව්‍යාපෘතියට අදාල නොවන අමතර නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	2017 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ කොටිකම්බොක්ක තිරුවානා නිධිය කැණීම් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2025 අප්‍රේල් 07 දින වන විටත් ආරම්භ කර නොතිබුණු අතර පරිපාලන වියදම්, මිනුම් කටයුතු, ස්ථාවර වත්කම් මිලට ගැනීම, සේවක වැටුප් ගෙවීම් සහ උපදේශන දීමනා වෙනුවෙන් 2017 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.27,865,149 ක් නිෂ්කාර්යව දරා තිබුණි.	ආයතනය මගින් ව්‍යාපෘතියට අදාල මූලික කටයුතු ඉටු කරගැනීම සඳහා මුදල් වියදම් කර තිබූ අතර, ඊට අදාලව මෑත කාලය තුල ව්‍යපෘතිය විශේෂ ප්‍රගතියක් ලබා කරගෙන ඇත. අමාත්‍ය මණ්ඩල තීරණවලින් හා රාජ්‍ය ආයතනවලින් ලබාදී ඇති නිර්දේශ අනුව ඉදිරි කටයුතු ඉටු කරගැනීමට නියමිතය.	ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය විධිවිධාන ආයතනය විසින් සලසා ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කන්තලේ සූරියපුර තුම්මෝදර වැලි ව්‍යාපෘතියට අදාළව 2022 වර්ෂයේ අගෝස්තු මස අවසානයේදී ව්‍යාපෘතිය භාර කැණීම් ඉංජිනේරුවරයාගේ සහ වැලි ගබඩා කිරීමේ අංගනය භාර ක්ෂේත්‍ර පරීක්ෂකවරයාගේ වාර්තාව ප්‍රකාරව වැලි කියුබ් 3658 ක් ගබඩාව තුළ භෞතිකව පවතින බව සහතික කර තිබුණද, එම ප්‍රමාණයෙන් වැලි තොගයක් භෞතිකව නොපැවතුණු බවට විගණන පරීක්ෂාවකින් අනාවරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2024 මැයි 07 දින විමර්ශන වාර්තාවක්ද නිකුත් කර තිබියදී ඒ අනුව කටයුතු නොකර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත රු.10,603,916 ක වැලි තොගයේ වටිනාකම පොත්වලින් කපා හැර තිබුණ අතර 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ව්‍යාපෘතිය භාර කළමනාකරු ලෙස සේවය කළ කැණීම් ඉංජිනේරුවරයා විසින් 2024 මැයි 06 වන දින ඉදිරිපත් කරන ලද ඉල්ලා අස්වීමේ ලිපිය පිළිගෙන ඔහුට රු.191,187 ක පාරිතෝෂිත දීමනාව ද 2024 ජුනි 14 දින ගෙවා තිබුණි.	කන්තලේ සූරියපුර වැලි ඌනතාවය සමඟ අමාත්‍යාංශය විසින් විමර්ශන කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හරහා එම වැලි කියුබ් අස්ථාන ගත වීම සම්බන්ධව තාක්ෂණික වාර්තාවක් සපයා ඇත. එම වාර්තාව පරිශීලනය කර ඇති අතර එසේම එම ව්‍යාපෘතියේ සේවය කරන ලද සේවකයන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටී.	වැලි ඌනතාවය සම්බන්ධයෙන් වන විමර්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට සමාගම කටයුතු කළ යුතු අතර එමගින් අලාභ පියවා ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.5,124,774 ක පාරිභෝගික ද්‍රව්‍ය තොගය සහ රු.40,445 ක් වූ නිව් ටවුන් වැලි විකුණුම් මධ්‍යස්ථානයේ තොගය සම්බන්ධයෙන් භෞතික තොග සමීක්ෂණයන් සිදුකර නොතිබුණි.	මාසිකව ගිණුම් අංශය වෙත එවන ලද තොග වාර්තා භෞතික තොගය පදනම් කරගෙන ස්ථානභාර නිලධාරීන් විසින් ගණනය කරනු ඇතැයි උපකල්නය කරනු ලැබේ. එමෙන්ම විශේෂ වැලි තොග ගණනයක් අඛණ්ඩව සිදුකළ යුතු නම් එය විගණන අංශ විසින් ලිඛිතව ලබා දිය යුතු අතර එහි දී තොග ගණනය කිරීමේ පිරිවැය හා කාලය පිළිබඳ ඔවුන් ලබා දෙන නිර්දේශ මත ඉදිරියේ දී ක්‍රියාත්මක කළ හැකිය.	සමාගම විසින් භෞතික තොග සත්‍යාපනයන් අදාළ පරිදි සිදුකළ යුතුය.

(ඇ)	2018 සහ 2019 වර්ෂවලදී අස්ථානගත වූ රු.671,650 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 02 කට අදාළ පරීක්ෂණ කටයුතු නිම කර නොතිබුණි.	අස්ථානගත ස්ථාවර වත්කම් අයිතම සම්බන්ධයෙන් විමර්ශන කමිටු පත්කර ඇති අතර මේ වන විට කටයුතු සිදු වෙමින් පවතින අතර අවසන් නිර්දේශයන් ගිණුම් අංශය වෙත ලැබී නැත.	අදාළ විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභයන් අයකර ගත යුතුය.
(ඈ)	2014 - 2020 කාලය තුළ රු.522,555 ක් වටිනා ටෝනර් 43 ක් මිල දී ගෙන තිබුණ ද ඒවාට අදාළ මුද්‍රණ යන්ත්‍ර ආයතනය තුළ නොපැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ටෝනර් යල්පැනගිය තොග ලෙස හඳුනාගෙන තිබුණි.	රු.522,555 ක් වටිනා Toner සහ Cartridges 50 ක් ඒවාට අදාළ මුද්‍රණ යන්ත්‍ර ආයතනය තුළ නොපැවතීම සහ තවත් යම් ප්‍රමාණයක් අලුත්වැඩියා කල නොහැකි බවට විනිශ්චය කරන ලදුව භාවිතයෙන් ඉවත් කර තිබීම හේතුවෙන් ගබඩාව තුළ තොගයක් වශයෙන් පවත්වාගෙන ගොස් ඇත. මෙම තොගය ඉදිරියේදී මිලදී ගන්නා යම් මුද්‍රණ යන්ත්‍රයක්/යන්ත්‍ර සඳහා භාවිතා කල හැකිද යන්න අවිනිශ්චිතතාවයක් පැවති අතර, යම් කාලයක් තිස්සේ භාවිතා නොවූ බැවින් ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දුන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් පත්කරන ලද කමිටුවක් මඟින් අධ්‍යනය කිරීමෙන් අනතුරුව අලවි කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.	අනවශ්‍ය ලෙස සිදුකරන ලද මිලදී ගැනීම්වලට වගකිව යුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සේවය කරනු ලබන කැණීම් ඉංජිනේරුවන්ට ලබාදෙන වෘත්තීය දීමනාව සඳහා ලබාදී තිබූ අමප/14/0385/527/009 දරන හා 2014 මැයි 29 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම් කර ගනිමින් සමාගම විසින් ද 2024 පෙබරවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සමාගමේ සේවය කරන කැණීම් ඉංජිනේරුවන් සඳහා වෘත්තීය දීමනාව ලෙස රු.2,189,292 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි.	පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2014 මාර්තු 10 දිනැති සංදේශයක් මගින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සේවයේ නියුතු ඉංජිනේරුවන් සඳහා ඉංජිනේරු දීමනාවක් ලබා දීමට යෝජනා කර ඇත. මෙම දීමනාව ක්‍රියාත්මක කිරීම සඳහා 2014 මැයි 29 දින කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව සමගමේ කැණීම් ඉංජිනේරුවන්ගේ විශේෂිත වෘත්තීය දායකත්වය වෙනුවෙන් 185 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මව් සමාගමේ පරිදි අදාල දීමනාව ගෙවීමට අනුමැතිය ලබාදී ඇත.	කාර්යාංශයෙන් වෙන් වූ නෛතික ඒකකයක් ලෙස ස්ථාපිත කර තිබූ මේ සමාගම සඳහා එම අමාත්‍ය මණ්ඩල තීරණය අදාළ කරගත නොහැකි බැවින් ගෙවන ලද වෘත්තීය දීමනාව ආපසු අයකර ගත යුතුය.
(ඊ)	2014 හා 2020 වර්ෂවලදී මුතුර් පරෙයිපක්ක්ඩං හා මුලතිව් බොරළු ව්‍යාපෘති සඳහා දිසා වන කාර්යාල වෙත තැන්පතු ලෙස ගෙවා තිබූ රු.680,000 ක් නිදහස් කර ගැනීමට හා 2013-2015	මුතුර් පරෙයිපක්ක්ඩං ව්‍යාපෘති සඳහා දිසා වන කාර්යාලය වෙත ගෙවා තිබූ තැන්පතු මුදල නිදහස් කර ගැනීම සඳහා 2024 නොවැම්බර් 20 වන දින ත්‍රිකුණාමලයේ දිසා වන නිලධාරි වෙත ලිපියක් ඉදිරිපත්	තැන්පතු මුදල් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින්

අතර කාලය තුළ ලොරි රථ සඳහා තැන්පතු ලෙස ආයතනයට ලැබී තිබූ රු.648,000 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	කර ඇතත් මේ වන තෙක් එම මුදල් නැවත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර නොමැත. මුලතිව් බොරළු ව්‍යාපෘතියට අදාල රු.400,000 ක තැන්පතු මුදල නිදහස් කිරීමට ලිඛිත දැනුම් දීම් දිගින් දිගටම සිදුකර ඇති අතර එහි පුනරුත්තාපන කටයුතු නිසි ලෙස සිදුකර නොමැති බැවින් එම මුදල නිදහස් කළ නොහැකි බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දන්වා ඇත.	සිදුකළ යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ හිටපු කළමනාකරු (පරිපාලන හා මහජන සම්බන්ධතා) 2019 මැයි 16 දින සිට ආයතනයේ සේවය හැර යන ලද්දෙකු සේ සලකා සේවයෙන් ඉවත් කිරීම හේතුවෙන් එම නිලධාරියා සමාගමට එරෙහිව කොළඹ කම්කරු විනිශ්වය අධිකාරියේ නඩු පවරා තිබුණි. එම නඩුවේ තීන්දුව ප්‍රකාරව අදාල නිලධාරියාගේ සේවය අවසන් කිරීම අසාධාරණ බවට කම්කරු විනිශ්වය සභා අධිකාරිය නිගමනය කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.1,521,000 ක් නිලධාරියාට හා නීති ගාස්තු ලෙස රු.405,000 ක් සමාගම විසින් ගෙවා තිබුණි. සමාගමේ දුර්වල මානව සම්පත් පරිපාලනය හේතුවෙන් රු.1,926,000 ක් මෙසේ නිෂ්කාර්යව සමාගමට දැරීමට සිදුව තිබුණි.	ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් මෙම නිලධාරියාව ආයතනයේ සේවා අවශ්‍යතාව මත බව පවසමින් 2019 මාර්තු 11 වන දින සිට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 28 කණුව ව්‍යාපෘතිය වෙත සේවා ස්ථානමාරු කර තිබුණි. සාධාරණ හේතු දක්වමින් එම ස්ථාන මාරුව අවලංගු කරන ලෙස ඉල්ලා තිබුණද ආයතනයේ ඉහළ කළමනාකාරීත්වය විසින් අදාල ඉල්ලීම් සලකා බලා නොතිබුණි. සේවා ස්ථාන මාරුව සම්බන්ධයෙන් ආයතනය විසින් සිහි කැඳවීම් කිහිපයක් යොමු කලද මොහු අදාල ස්ථානය වෙත වාර්තා නොකළ බැවින් ඔහු සේවය හැරගිය අයෙකු සේ සලකා ඇත. කම්කරු නීතිරීති සැලකිල්ලට නොගෙන සේවා ස්ථාන මාරු සහ සේවා අත්හිටුවීම් සිදු කිරීම නිසා මේ තීරණ සඳහා කිසිදු සම්බන්ධතාවයක් නොමැති මානව සම්පත් අංශයට පසුකාලීනව නඩු කටයුතු වෙනුවෙන් පෙනී සිටීමට සිදු විය.	ආයතනයේ දුර්වල මානව සම්පත් පරිපාලනය හේතුකරගෙන අතිවූ මෙම නිශ්කාර්ය වියදම සඳහා අදාල නිලධාරීන් වගකිවයුතු බැවින් ඒ සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	සමාගම 2023 ඔක්තෝබර් 09 දින සිට බලපැවැත්වෙන පරිදි නිලධාරීන් 35 දෙනෙක් සේවයේ ස්ථිර කර තිබුණි. මෙහිදී සියළුම අභ්‍යන්තර සේවකයින් වෙතින් අයදුම්පත්‍ර ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඒවා ඇගයීමට ලක්කර සුදුසු අයදුම්කරුවන් තෝරා ගෙන ස්ථිර කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. එසේ වුවද ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා කාර්යසාධන ඇගයීම් ක්‍රියාපරිපාටිය නිසි අයුරින් සිදුකර ඇති බවත් සම්මුඛ පරීක්ෂණවලට භාජනය කර තෝරා ගත් බවත් සඳහන් කර 2023 සැප්තැම්බර් 21 දින පැවති 182 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.	2023 වසරේ ආයතනයේ සේවකයින් ස්ථිර කිරීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේ විමර්ශන අංශය විසින් ඉදිරිපත් කල වාර්තාව සහ සවිස්තරාත්මක වාර්තාවක් යොමු කරන ලෙස දන්වා අමාත්‍යාංශයේ විගණන සහ කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත පත්කළ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටු වාර්තාවන්හි නිර්දේශ සැලකිල්ලට ගනිමින් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග විමසා ආයතනයේ 194 වන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් යොමු කර ඇත.	ආයතනයේ සේවකයන් ස්ථිර කිරීම නිසි ක්‍රමවේදයට අනුව සිදුකළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භූ විද්‍යා අංශය විසින් ක්‍රියාත්මක කළ පාරිසරික අධ්‍යයනයන් සහ අනෙකුත් භූ විද්‍යා ව්‍යාපෘති සඳහා පිළිවෙලින් සියයට 23 සහ සියයට 42 ක් ලෙස අඩු කාර්යසාධන මට්ටමක් ළඟා කරගෙන තිබුණි.	කාර්යසාධන වාර්තාවේ ප්‍රගතිය අඩු වීමේ හෝ ශූන්‍ය වීමේ වගකීම අදාළ අංශ ප්‍රධානීන් භාරගත යුතුය.	අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා සමාගමේ මානව සම්පත් අංශය, අලෙවි හා සැලසුම් අංශය, ප්‍රසම්පාදන හා ගබඩා අංශය, නීති අංශය හා තොරතුරු තාක්ෂණ අංශය යන අංශවල කාර්යභාරයන් ඇතුළත් කර නොතිබුණි.	ආදායම් උත්පාදන නොවන අංශ ඇතුළත් කළ යුතු බවට අපට උපදෙස් ලබා දී නොමැත. මෙය නිවැරදි කිරීම සඳහා මේ වන විට අදාළ අංශයන්ට ක්‍රියාකාරී සැලසුම් ලබා දෙන ලෙස ඉල්ලුම් කොට ඇත. ඉදිරියේදී එය අධ්‍යක්‍ෂක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.	ආයතනයේ සියලුම අංශයන්ගේ කාර්යභාරය නියෝජනය වන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය.